# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2062/42 - 2018 මාර්තු මස 16 වැනි සිකුරාදා - 2018.03.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* 2/2/1/144– 52/2017
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/7/2016/එච්ඩබ්ලිව්/443

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර :*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගලහිටියාව ගමේ, අංක 215බී, ගලහිටියාව නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2018.01.24. දිනැතිව පිළියෙල කරන ලද මූලික පිඹුරු අංකය ගම් 4075 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0. 2819 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි (18);

**01. කැබලි අංක 1**
ඉඩමේ නම: මුණමල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 30 පමණ වයසැති ඇට්ටෝනියා ගසක් ඇත; හිමිකම් කියන අය: ජේ.එල්.ඒ. ආරිය භද්‍රා ඒකනායක, අංක 165 ඒ, ගලහිටියාව, ගණේමුල්ල; මුල් හිමිකම් පාන්නා: (අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0022

**02. කැබලි අංක 2**
ඉඩමේ නම: මුණමල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 30 පමණ වයසැති පොල්ගස් 02 ඇත; හිමිකම් කියන අය: කේ. එස්. සිල්වා, අංක 165/ ඩී, ගලහිටියාව, ගණේමුල්ල; මුල් හිමිකම් පාන්නා: ( අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0112

**03. කැබලි අංක 3**
ඉඩමේ නම: මුණමල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 10 පමණ වයසැති පොල්ගස් 04 සහ අවු. 50 පමණ වයසැති පොල් ගස් 04 ක් ඇත; හිමිකම් කියන අය: එස්. එම්.ඩී. සමරකෝන්, අංක 235සී, ගලහිටියාව, ගණේමුල්ල; මුල් හිමිකම්පාන්නා: ( අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0243

**04. කැබලි අංක 4**
ඉඩමේ නම: මුණමල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලකින් කොටසක්, සිමෙන්තියෙන් බඳින ලද ළිඳක්, අවු. 10 ක් පමණ වයසැති කොස්ගස් 02, අවුරුදු 5 ක් පමණ වයසැති මහෝගනී ගස් 02 සහ අවු. 8 පමණ වයසැති රඹුටන් ගස් 02 ඇත; හිමිකම් කියන අය: ඩබ්ලිව්. ඒ. ආර්. ඩී. වීරබන්දු, අංක 237 බී, ගලහිටියාව, ගණේමුල්ල සහ සමිත උවත්මි වික්‍රමරත්න, සී/ඩී - 9/17, රන්පොකුණුගම, නිට්ටඹුව; මුල් හිමිකම්පාන්නා: (අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0220

**05. කැබලි අංක 5**
ඉඩමේ නම: මුණමල්ගහවත්ත; විස්තරය: පාර; හිමිකම් කියන අය: සමිත උවත්මි වික්‍රමරත්න, සී/ඩී-9/17, රන්පොකුණුගම, නිට්ටඹුව, එච්.ඒ.ලහිරු උදාන සහ තවත් අය, 237/1, ගලහිටියාව, ගණේමුල්ල; මුල් හිමිකම්පාන්නා: (අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0043

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

06. කැබලි අංක 6
ඉඩමේ නම: මුණමල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලකින් කොටසක්, අවු. 50 පමණ වයසැති සියඹලා ගසක් සහ අවු.15 ක් පමණ වයසැති අඹ ගසක් ඇත; හිමිකම් කියන අය: ඩබ්ලිව්.ඒ.එම්. වීරසිංහ, අංක 237, ගලහිටියාව, ගණේමුල්ල; මුල් හිමිකම්පාන්නා: (අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0171

07. කැබලි අංක 7
ඉඩමේ නම: මුණමල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: එස්. එම්. ඩී. සමරකෝන්, අංක 235/සී, ගලහිටියාව, ගණේමුල්ල; මුල් හිමිකම්පාන්නා: (අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0031

08. කැබලි අංක 8
ඉඩමේ නම: ජයකොඩිවත්ත; විස්තරය: ශ්‍රී ලංකා පොලීසිය, ගණේමුල්ල; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: (ගම් 2007 වැනි මුලික පිඹුරේ 1 වැනි බිම් කැබැල්ලේ කොටසක්, ගණේමුල්ල ගුවන් පාලම ඉදිකිරීම සඳහා අවශ්‍යව ඇත); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0144

09. කැබලි අංක 9
ඉඩමේ නම: ජයකොඩිවත්ත; විස්තරය: ගෙවත්ත සහ ශ්‍රී ලංකා පොලිස් ක්‍රීඩාංගනය, ගණේමුල්ල; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: ( ගම් 2007 වැනි මුලික පිඹුරේ 1 වැනි සහ 2 වැනි බිම් කැබලිවල කොටස්, ගණේමුල්ල ගුවන් පාලම ඉදිකිරීම සඳහා අවශ්‍යව ඇත);ප්‍රමාණය: හෙක්ටයාර් 0.0903

10. කැබලි අංක 10
ඉඩමේ නම: ජයකොඩිවත්ත; විස්තරය: බෝධිසරය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: ( ගම් 2007 වැනි මුලික පිඹුරේ 2 වැනි බිම් කැබැල්ලේ කොටසක්, ගණේමුල්ල ගුවන් පාලම ඉදිකිරීම සඳහා අවශ්‍යව ඇත);ප්‍රමාණය: හෙක්ටයාර් 0.0053

11. කැබලි අංක 11
ඉඩමේ නම: ජයකොඩිවත්ත; විස්තරය: ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, ගණේමුල්ල; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: (ගම් 2679 වැනි මුලික පිඹුරේ 1වැනි බිම් කැබැල්ලේ කොටසක්, ගණේමුල්ල ගුවන් පාලම ඉදිකිරීම සඳහා අවශ්‍යව ඇත); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0016

12. කැබලි අංක 12
ඉඩමේ නම: ජයකොඩිවත්ත; විස්තරය: ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, ගණේමුල්ල, සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: (ගම් 2679 වැනි මුලික පිඹුරේ 1 වැනි බිම් කැබැල්ලේ කොටසක්, ගණේමුල්ල ගුවන් පාලම ඉදිකිරීම සඳහා අවශ්‍යව ඇත); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0205

13. කැබලි අංක 13
ඉඩමේ නම: ජයකොඩිවත්ත; විස්තරය: තැපැල් කාර්යාලය, ගණේමුල්ල සහ සෞඛ්‍ය මධ්‍යස්ථානය, ගණේමුල්ල; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: (ගම් 2964 වැනි මුලික පිඹුරේ 1 වැනි සහ 2 වැනි බිම් කැබලිවල කොටසක් සහ 16083 වැනි මුලික පිඹුරේ 2 වැනි බිම් කැබැල්ලේ කොටසක්, ගණේමුල්ල ගුවන් පාලම ඉදිකිරීම සඳහා අවශ්‍යව ඇත); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0081

14. කැබලි අංක 14
ඉඩමේ නම: ජයකොඩිවත්ත; විස්තරය: බුදු මැදුර (කොටසක්); හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: (16083 වැනි මුලික පිඹුරේ 2 වැනි බිම් කැබැල්ලේ කොටසක්, ගණේමුල්ල ගුවන් පාලම ඉදිකිරීම සඳහා අවශ්‍යව ඇත); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0006

15. කැබලි අංක 15
ඉඩමේ නම: දෙල්ගහවත්තේ කොටස; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත.; හිමිකම් කියන අය: සිදත් පණ්ඩුල වැලිවිට, අංක 296, කැන්දලියැද්දපාලුව, ගණේමුල්ල; මුල් හිමිකම්පාන්නා: (අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0001

16. කැබලි අංක 16
ඉඩමේ නම: මිල්ලගහවත්ත *නොහොත්* ගණේමුල්ල එස්ටේට්; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: එම්. ඒ. ඉන්දික ගයාන් මුණසිංහ, අංක 292/ 6 ඒ, ජයකොඩිවත්ත, ගණේමුල්ල; මුල් හිමිකම්පාන්නා: (අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0206

17. කැබලි අංක 17
ඉඩමේ නම: මිල්ලගහවත්ත; විස්තරය: ගෙවත්ත, තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම්පාන්නා: (16083 වැනි මුලික පිඹුරේ 3 වැනි බිම් කැබැල්ලේ කොටසක්, ගණේමුල්ල ගුවන් පාලම ඉදිකිරීම සඳහා අවශ්‍යව ඇත); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0324

18. කැබලි අංක 18
ඉඩමේ නම: මුණමල්ගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: ඩබ්ලිව්.ඒ.ආර්.එස්. වීරසිංහ, අංක 233/ඊ, ගලහිටියාව, ගණේමුල්ල; මුල් හිමිකම් පාන්නා: (අත්කර ගැනීම සඳහා); ප්‍රමාණය: හෙක්ටයාර් 0.0038

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2018 මාර්තු මස 28 වැනි දින අනුව පෙරවරු 9.30 ට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2018.03.25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලු හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරී,
ගම්පහ

2018 මාර්තු මස 15 වැනි දින,
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

03 - 1362

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.